සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය

**නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 02 යි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

### I කොටස

(01) පුද්ගලයාට හිමි අයිතිවාසිකම් අතරින් සිවිල් අයිතිවාසිකමක් වන්නේ,

(1) ජීවත්වීමේ අයිතිය
(2) ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය
(3) ඡන්දය ලබා ගැනීමේ අයිතිය
(4) තමා කැමති නායකයෙක් තෝරා ගැනීමේ අයිතිය

(02) සාර්ථක ජීවන අරමුණකට ළඟා වීම සඳහා ඔබ විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.

(1) දිනපතා පාසල් යෑම.
(2) ක්‍රීඩාවන්ට පමණක් මුල් තැන දීම.
(3) අඩු සාධන මට්ටම් සහිත විෂයයන් මග හැර යාම.
(4) කාල සටහනකට අනුව අධ්‍යාපන කටයුතුවල නිරත නොවීම.

(03) ක්‍රීඩාවල නිරත වීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංගයක් වන්නේ,

(1) කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීමට අකමැති වීම.
(2) පරාජය විඳ ගැනීමේ දී ගැටළු මතුවීම.
(3) සාධාරණත්වය අගය කිරීම හා නීතිගරුක වීම.
(4) වින්දනය හා සතුට අවම වීම.

(04) විස්තෘත පවුලක දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ,

(1) සාමාජික සංඛ්‍යාව වැඩි නිසා පවුලේ ශක්තිය වැඩිවීම.
(2) බාල පරපුරට සංස්කෘතිය පවරා දීමේ පහසුව
(3) දරුවන් රැක ගැනීමේ වගකීම පවුලේ සමාජිකයන් අතර බෙදීයාම.
(4) මව, පියා සහ දරුවන් පමණක් එකට ජීවත් වීම.

(05) භාණ්ඩයක් මිල දී ගැනීමේ දී සැලකිය යුතු කරුණක් විය යුත්තේ,

(1) ශුද්ධ බර
(2) කල් ඉකුත්වන දිනය නොසැලකීම.
(3) අඩු මුදලට වැඩි ප්‍රමාණයක් මිල දී ගත හැකි වීම.
(4) ගුණාත්මක භාවයට වඩා රස පිළිබඳ අවධානය යොමු කිරීම.

I පහත දැක්වෙන වාක්‍ය නිවැරදි නම් ( 4 ) ලකුණ ද වැරදි නම් ( 5 ) ලකුණ ද යොදන්න.

(06) විස්තෘත පවුල් ව්‍යාප්ත පවුල ලෙසින් ද හැඳින්වේ. (...............)

(07) පුද්ගලයා සුවිශේෂී ව හඳුනා ගැනීමට DNA පරීක්ෂණය වැදගත් වේ. (...............)

(08) අප මුලින් ම සාමාජිකත්වය ලබන සමාජ ඒකකය පාසලයි. (...............)

(09) චරිතාපදාන කියවීමෙන් ජීවිතයට වැදගත් ආදර්ශ ලබාගත හැකිය. (...............)

(10) සිත තුළ ඇති වන චිත්තවේග මුහුණෙන් හඳුනාගත නොහැක. (...............)

I අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(කල්‍යාණ මිත්‍රයන්, අභියෝග, යුතුකම්, පවුල, පූර්වාචාරීන්)

(11) ජන සමාජයේ කුඩා ම ඒකකය ..................................................................වේ.

(12) දෙමාපියන් ............................................................. ලෙස සමාජය පිළිගනී.

(13) පාසල් සිසුවෙකු ලෙස අයිතිවාසිකම් භුක්ති විඳිමින් ........................................................... ඉටු කළ යුතුය.

(14) සමාජයේ ජීවත්වන සෑම පුද්ගලයෙකු ම ......................................................... වලට මුහුණ දීමට සිදුවේ.

(15) ඔබේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේගයක් ලෙස ......................................................... හඳුන්වා දිය හැකිය.

I නිවැරදි පිළිතුර යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(16) හදිසි අවස්ථාවක දී භාවිත කළ යුතු ඇමතුම් අංකය ................................................................ වේ.

(17) භාණ්ඩවල සිල්ලර මිල දැක්වෙන දර්ශනය .............................................................

(18) ඔබේ පියාගේ මල්ලීගේ දියණිය ඔබගේ ...........................................................................

(19) මත් ද්‍රව්‍ය හා දුම්වැටි නිසා මාරාන්තික ......................................................................................... රෝගය වැළදේ.

(20) ඔබ සතු උසස් ගතිගුණ හා හැකියා පිළිබඳ ඇති වන්නේ ..................................................................................

## II කොටස

I පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

(01) (1) සමාජයේ දැකිය හැකි පවුල් වර්ග දෙකක් නම් කරන්න.

(2) අසල්වාසීන් සමඟ සුහද ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

(3) පවුලේ සාමාජිකයන් ලෙස ජීවත්වීම නිසා අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(4) විභාගය ජය ගැනීමේ අරමුණ සාර්ථක කර ගැනීමට ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

(5) ඔබට වැදගත්වන උපදේශාත්මක කවි ඇතුළත් පොත් දෙකක් සඳහන් කරන්න.

(6) ඔබ ප්‍රදේශයේ බහුල ව ජීවත්වන ජන වර්ග දෙකක් නම් කරන්න.

(7) ඔබට තොරතුරු ලබාගත හැකි විද්‍යුත් මාධ්‍ය දෙකක් නම් කරන්න.

(8) කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට අයත් රැකියා දෙකක් සඳහන් කරන්න. (2 x 8 = 16)

(02) (1) විස්තෘත පවුලක ඇති වාසි දෙකක් ලියන්න. (ලකුණු 2)

(2) පවුලක දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 4)

(3) පහත කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු5)

දෙගුරුන් ගුරු දුටු දෙවියන් ලෙස සිතමු

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(03) (1) සමාජ යහපතට හේතු වන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(2) විවේක කාලයේ දී කළ හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ලකුණු 4)

(3) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා අත්වන ප්‍රයෝජන තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ලකුණු 5)

(04) (1) පුද්ගලයන් තුළ ඇතිවන චිත්තවේග තත්ත්ව දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)

(2) ඔබ තෝරාගත් චිත්තවේගී අවස්ථාවන් හි පුද්ගලයාගේ හැසිරීම් දෙකක් බැගින් ලියන්න. (ලකුණු 4)

(3) විවේකය ඵලදායි ලෙස ගත කළ හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ලකුණු 5)

(05) (1) ඔබගේ පවුලේ සාමාජිකයින් අන්තර් සම්බන්ධතා පවත්වන සමිති දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(2) ආගමික සංවිධානයකින් ඉටුවන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 4)

(3) අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ලකුණු 5)

(06) (1) දත්ත යනුවෙන් හඳුන්වන්නේ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(2) අධ්‍යාපනය සඳහා දත්ත ලබාගත හැති දෘෂ්‍ය මාධ්‍ය හතරක් ලියන්න. (ලකුණු 4)

(3) පුද්ගලයෙකුට දෛනික ව අවශ්‍ය වන තොරතුරු වර්ග පහක් ලියන්න. (ලකුණු 5)

(07) (1) දරුවෙකුගේ අනිවාර්ය අධ්‍යාපන වයස ලියා දක්වන්න. (ලකුණු 2)

(2) සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට යොදා ඇති විධිවිධාන දෙකක් දක්වන්න. (ලකුණු 4)

(3) සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇතිවිය හැකි අවාසි දෙකක් දක්වා එකක් විස්තර කරන්න.

(ලකුණු 5)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 1 | (6) 4 | (11) පවුල | (16) 119 |
| (2) 1 | (7) 4 | (12) පූර්වාචාරීන් | (17) මිල දර්ශනය |
| (3) 3 | (8) 5 | (13) යුතුකම් | (18) ඥාති සහෝදරියයි |
| (4) 4 | (9) 5 | (14) අභියෝග | (19) පිළිකා |
| (5) 1 | (10) 5 | (15) කල්‍යාණ මිත්‍රයන් | (20) ආත්මාභිමානය |

(ලකුණු 2 x 20 = 40)

### II පත්‍රය

(01) (1) න්‍යෂ්ටික පවුල/ විස්තෘත පවුල

(2) සුහදත්වය වර්ධනය වේ/ හදිසි අවස්ථාවල උදව් උපකාර කරයි.

(3) ආහාර හා පෝෂණය ලැබේ/ ආදරය, කරුණාව, දයාව / අධ්‍යාපනය

(4) ගුරු උපදෙස් පිළිපැදීම/ දිනපතා පාසල් යාම/ කාලසටහනකට වැඩ කිරීම/ හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම.

(5) සිරිත් මල් දම/ සුභාෂිතය/ ලෝ වැඩ සඟරාව

(6) සිංහල / මුස්ලිම්

(7) ගුවන් විදුලිය /රූපවාහිනිය

(8) වී ගොවිතැන/ කොරටු වගාව/ සත්ත්ව පාලනය/ හාල් මෝල් ආශ්‍රිත රැකියා/ කිරි නිෂ්පාදන

(02) (1) පවුලේ ශක්තිය වැඩිය/ දරුවන් රැකබලා ගැනීමේ වගකීම් බෙදීයාම/ බාල පරපුරට සංස්කෘතිය පවරා දීමේ පහසුව

(2) ඥාතිත්වය මත ගොඩනැගී තිබීම/ සමාජිකයින් එක් වාසස්ථානයක ජීවත්වීම/ සාමාජිකයින් අතර සමීප සබඳතා පැවතීම (පෙළ පොත 5 පිටුව)

(3) දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු
උතුමන් බසින් ඉටු දෙවියන් දැක ගනිමු
එබැවින් නිතින් මේ දෙවියන් දැක ගනිමු
බැලුමෙන් හොඳින් ගුරු දෙගුරුන් රැක ගනිමු

(03) (1) පවුල/ පාසල/ ආගමික ආයතන/ කලණ මිතුරන්/ හොඳ පොත්

(2) චිත්‍ර ඇඳීම/ සංගීතයට සවන් දීම/ ගීත, කවි නිර්මාණය

(3) විනෝදය/ වින්දනය/ චිත්තවේග පාලනය/ චිත්තවේග සංයමයෙන් ප්‍රකාශ කිරීමේ හැකියාව/ ජීවිතය සෞන්දර්යාත්මක ව දැකීමේ හැකියාව

**Answer**

(04) (1) සතුට/ දුක/ කෝපය/බිය

(2) සතුට සිනාසීම/ උඩ පැනීම/ අත්පුඩි ගැසීම

දුක හැඬීම/ සුසුම් ලෑම/ නිහඬව සිටීම ආදී පිළිතුරු

(3) ආගමික කටයුතුවල යෙදීම/ ඇවිදීම/ පොත්පත් කියවීම/ ක්‍රීඩාවල නිරත වීම/ පරිසර සෞන්දර්ය නැරඹීම (පෙළපොත 29 පිටුව)

(05) (1) මරණාධාර සමිති/ ග්‍රාම සංවර්ධන සමිති/ කාන්තා සමිති

(2) ආගම ඉගැන්වීම/ සාරධර්ම හුරු කිරීම/ අධ්‍යාත්මික සංවර්ධන සමාජය විනයවත් කිරීම.

(3) ඉවසීම/ දරා ගැනීමේ ශක්තිය/ ස්ථිරසාර බව/ උත්සාහය/ උපක්‍රමශීලි බව / උපායශීලී බව

(06) (1) කිසියම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර දත්ත වේ.

(2) රූපවාහිනිය/ පුවත්පත/ සඟරා/ දැන්වීම්/ පරිගණක/ පොත්

(3) කාලගුණික අනාවැකි/ වෙළඳපොල මිල ගණන්/ හදිසි දුරකතන අංක/ විනිමය අනුපාත/ ලුහුඬු දැන්වීම්/ රැකියා තොරතුරු

(07) (1) අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 05 14

(2) කම්කරු නීති/ සේවක අර්ථසාධක අරමුදල/ රක්ෂණ ක්‍රම මානව හිමිකම් කොමිෂම/ ආයතන සංග්‍රහය

(3) ශ්‍රම සූරාකෑම/ සේවක අතෘප්තිය/ සාධාරණ වැටුප් නොලැබීම/ සේවක අසාධාරණකම් සිදු වීම/ වෘත්තික සුරක්ෂිත බව නැති වීම ආදි..... (පෙළ පොත 64 පිටුව)

පළමු ප්‍රශ්නයට

(01) ප්‍රශ්නයට ලකුණු = 2 x 8 = 16

අනෙක් ප්‍රශ්නයකට,

| | | |
|---|---|---|
| I කොටස | = 2 | 11 බැගින් |
| II කොටස | = 4 | |
| III කොටස | = 5 | |